

# ජාතික පුරාවිද්‍යා සමුළුව

# NATIONAL ARCHAEOLOGICAL SYMPOSIUM 2003

දේශන ඉදිරිපත් කිරීම - සාරාංශ
Lecture Presentation – Abstracts

**July 07- 08, 2003**

Sri Lanka Foundation Institute
Independence Square
Colombo 07

# අත්තානි කණු ශිලාලේඛන පිළිබඳ නව අර්ථකථනයක්

අනුර මනතුංග
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
පුරාවිද්‍යා අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ අභිලේඛන අතර අත්තානි කණුවලට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. අනුරාධපුර යුගයේ අවසන් කාලයට අයත් මෙවැනි අත්තානි කණු විශාල ප්‍රමාණයක් දිවයිනේ නොයෙක් ප්‍රදේශවලින් හමු වී ඇත. ඒවා පොදුවේ ගත් කළ සමාන අර්ථයකින් යුක්තය. මෙතෙක් විශ්වාස කළ පරිදි එම ලිපි පිහිටුවනු ලැබුවේ යම රාජ්‍ය නිලධාරීන් පිරිසකට එකී ලිපිවල දැක්වෙන විහාරාරාම හෝ ගම්මානවලට ඇතුල්වීම තහනම් කරමින් පනවනු ලැබූ ව්‍යවස්ථාවන් ලෙසය. එම ව්‍යවස්ථාවන් කඩ කරමින් එකී ස්ථානවලට ඇතුල් වන්නන් කවුඩන්,බල්ලන් වැනි පහත් තත්ත්වයට පත් කෙරෙන අවමාන පාඨයන් ද මේ බොහෝ ලිපිවල අන්තර්ගතය.

රාජ්‍ය සභාවේ අනුමැතියෙන්. රාජ්‍ය නිලධාරීන් රාජ්‍යයේ ස්ථානවලට ඇතුල්වීම තහනම් කරමින් නියෝග පැනවීමක් මේ ලිපිවලින් අදහස් කරන බව විශ්වාස කරනු ලැබීමට ප්‍රධාන හේතුවක් වූයේ මේ ලිපි වැඩි කොටසක එසේ ඇතුල්වීමට තහනම් කරනු ලැබූ පුද්ගලයන් ලෙස රජ් කොල් සම්දරුවන් හෝ රජ් කොල් කැමියන් යන පුද්ගලයන් ඇතුලත් වී තිබීමය. මෙය මෙතෙක් තේරුම්ගනු ලැබුවේ රාජ්‍ය සභාවේ නිලධාරීන් පිරිසක් ලෙසය. ඒ අනුව, හරිහැටි හඳුනාගත නොහැකි වූ අනෙකුත් නාම වලින් ද විවිධ රාජ්‍ය නිලධාරීන් අදහස් කෙරුණු බව විශ්වාස කරනු ලැබීය.

එහෙත් මගේ අධ්‍යයනයන් අනුව පෙනී යන්නේ රජ් කොල් සම්දරුවන් හෝ රජ්කොල් කැමියන් යනු රාජ්‍ය නිලධාරීන් නොව, රාජ අපරාධකරුවන් හෙවත් රාජ්‍යයට විරුද්ධව කෝලාහල කළවුන් බවය. අත්තානි කණු ලිපි මගින් ව්‍යවස්ථා පණවා ඇතැම් ගම්මාන සහ විහාරාරාමවලට ඇතුල්වීම තහනම් කරනු ලැබ ඇත්තේ ඔවුන්ට ය.

මෙතෙක් හරිහැටි අර්ථනිරූපනය නොකළ, නැතහොත් තවත් රාජ්‍ය නිලධාරීන් ලෙස තේරුම්ගත් වෙනත් බොහෝ දෙනෙකු ද මේ අනුව රාජ්‍යයට විරුද්ධව සටන් කළවුන් බව පැහැදිලි ය. ඉතා සරළව පැහැදිලි කළහොත්, මේ ලිපිවල නිතර හමුවන මෙලාට්ඨින් යනු පලා යන්නන් ය. පෙරනාට්ටුන් යනු එළවා දැමූවන් ය. මැගිව පියැගිව යනුවෙන් දක්වා ඇත්තේ සරණාගතයෝ ය. දෙකම්තැන් වැස්සන් යනු මායිම් වැස්සන් හෝ රාජ්‍ය දෙකකට ම අයත් හෝ අයත් නොවූ පුද්ගලයන්ය. පියොවදාරන්නන් යනු සටන් කරුවන් ය. මෙලෙස, මේ ලිපිවල එන රට් ලදුවන්, පස් ලදුවන් සහ නුවර ලද්දන් යනු බලහත්කාරයන් රටවල්, ප්‍රදේශ සහ නගර අල්ලාගත්තවුන් බව සිතාගත හැකිය. නොඑසේනම්, ඔවුන්ට මෙම ස්ථානවලට ඇතුල්වීම තහනම් කිරීමට හෝ

මිනීමරුවන්, හරක් හොරුන් වැනි  තහනම් ලැයිස්තුවට අඩංගු පුද්ගලයන් අතරට ඔවුන් ඇතුලත් කිරීමටත් හේතුවක් නොමැත.

මෙ අනුව, අත්තානි කණු ලිපි පොදුවේ ගත් කළ රාජ්‍යයේ ආරක්ෂාව පතා. රාජ්‍ය ද්‍රෝහීන්ට යම් යම් ස්ථානවලට ඇතුල්වීම තහනම් කරමින් රාජ සභාව මගින් පැනවූ ව්‍යවස්ථාවන් බව පැහැදිලිය.